# රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

අංක 1928/28 හා 2015.08.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්තියේ සහ අංක 2159/11 හා 2020.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 3 වන සේවා ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් විධිවිධාන අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරු සඳහා 2025.07.01 දිනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ජ්‍යෙෂ්ඨතාවය මත සුදුසුකම් ලැබූ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2025.07.25 වේ.

02. සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සලකා බලනු ලබන දිනය 2025.07.01 වේ.

03. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්

I. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට විධායක සේවා ගණයේ පළමු ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.

II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පහත සටහනේ සඳහන් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ විෂයයන්ගෙන් කවර විෂයයකට හෝ අයත් විෂයය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ බඳවා ගත් විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම. (සටහන 01 හා 02 අදාළ වේ)

IV. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ විධායක සේවා ගණයේ වසර දහඅටකට (18) නොඅඩු සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරා තිබීම.

VI. අනුමත කාර්යසාධන ඇගයීම් පටිපාටියට අනුව උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

සටහන : 01. සාමාන්‍ය සේවක සංඛ්‍යාව යටතේ සේවයට ඇතුළත් වූ නිලධාරීන් සඳහා විශේෂ අධ්‍යාපනය, අධ්‍යාපන කළමනාකරණය, අධ්‍යාපන මනෝ විද්‍යාව, අධ්‍යාපන ප්‍රතිපත්ති, තෘතියික අධ්‍යාපන කළමනාකරණය, පුස්තකාල හා තොරතුරු අධ්‍යාපනය, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇගයීම හා පරීක්ෂණ යන විෂය ක්ෂේත්‍රයන් අදාළ විෂය ක්ෂේත්‍රයන් වේ.

02. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නව සේවා ව්‍යවස්ථාව ප්‍රසිද්ධියට පත් කරන ලද දිනයට පෙර සම්පූර්ණ කර හෝ අවම වශයෙන් පශ්චාත් උපාධිය සඳහා ලියාපදිංචි වී හෝ ඇති අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා තිබීම ද ඉහත III සුදුසුකම් සපුරාලීම සඳහා සලකා බලනු ලැබේ. එම තොරතුරු සම්මුඛ පරීක්ෂණයේ දී විශ්වවිද්‍යාලයේ / උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයේ ලේඛකාධිකාරී විසින් නිකුත් කළ ලිපියක් මඟින් සනාථ කළ යුතුය. මෙම විෂයය ක්ෂේත්‍රයන් විෂයයක් ලෙස ඇතුළත් වන අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් ලබා තිබීම ද උක්ත III සුදුසුකම් සපුරාලීම සඳහා සලකා බලනු ලැබේ.

04. උසස් කිරීමේ ක්‍රමය:

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව, සේවයේ විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත පදනම්ව සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් සිදුකරනු ලැබේ.

II. 2025.07.01 දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගෙන් ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙළ අනුව, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් වශයෙන් ගැනෙන සංඛ්‍යාවට නොඅඩු නිලධාරීන් සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් එම නිලධාරීන්ගේ මූලික සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පමණක් පරීක්ෂා කරනු ලැබේ.

IV. එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරී සංඛ්‍යාවක් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

05. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය

මේ සමඟ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, 2025.07.25 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ශ්‍රී ලං.අ.ප.සේ. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම" යනුවෙන් සඳහන් කොට තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ඔබ විසින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇත්නම් පමණක් අයදුම්පත් ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් දන්වා සිටින අතර දැනට විශ්‍රාම ගෙන සිටියේ වුවද 2025.07.01 දිනට හෝ එදිනට පසු දිනයක් තෙක් සේවයේ යෙදී සිටි සහ උසස්වීමට ඉහත 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති හා නිවේදනයේ නම් සඳහන් නිලධාරීන් හට මෙම උසස්වීම් සඳහා ඉල්ලුම් කළ හැකිය.

07. මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ පමණින්ම හෝ සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින්ම හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස්වීම් ලැබීම සඳහා හිමිකමක් නොවන බව ද වැඩිදුරටත් අවධාරණය කර සිටිමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

නාලක කළුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

2025.07. 04

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>**

අංක 1928/28 හා 2015.08.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්තියේ සහ අංක 2159/11 හා 2020.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 3 වන සේවා ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් විධිවිධාන අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ අනුමත තනතුරුවල 2025.07.01 දිනට පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ජ්‍යෙෂ්ඨතාවය මත සුදුසුකම් ලැබූ පහත නම් සඳහන් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. එස්.ඒ.එන්.පෙරේරා මහතා - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පෞද්ගලික පාසල්), අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
2. බී.සී.පී. ප්‍රනාන්දු මහතා - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, මීගමුව
3. කේ.ඩබ්. අනුරුද්ධිකා කලහෙවත්ත මහත්මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, අම්බලන්ගොඩ
4. ජේ.ඒ.එම්.පී. ජයතිලක මහත්මිය - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, වයඹ පළාත
5. ඩබ්.ඒ.පී.ජේ. වික්‍රමසිංහ මහතා - විදුහල්පති, තර්ස්ටන් විද්‍යාලය, කොළඹ
6. ඩබ්.ඒ.එස්.බී. පෙරේරා මහත්මිය - විභාග කොමසාරිස්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ඒ අනුව මේ සමඟ පළවන නිවේදනයේ විධිවිධාන පරිදි සකස් කරන ලද අයදුම්පත 2025.07.25 දිනට පෙර යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

නාලක කළුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

2025.07. 04